**ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානය - 2021**

**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය **මධ්‍යස්ථානය** ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මධ්‍යස්ථානය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මධ්‍යස්ථානය මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මධ්‍යස්ථානය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මධ්‍යස්ථානයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මධ්‍යස්ථානය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01හි 53 වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කෙරෙන සියළුම සංඛ්‍යාත්මක තොරතුරු සඳහා සංසන්දනාත්මක තොරතුරු හෙලිදරව් කළ යුතු වුවද ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සඳහා සන්සන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 53 ඡේදය ප්‍රකාරව ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය තුල පසුගිය වර්ෂයේ තොරතුරු දක්වා ඇත. | ප්‍රමිතයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ අංක ප්‍රමිත 03 හි 54 ඡේදය ප්‍රකාරව එකතුව රු.3,934,469 ක් | වැරැදීමකින් මෙය සිදු වී ඇති අතර ඉදිරියේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 03 හි | ප්‍රමිතයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වූ පූර්ව කාලපරිච්ඡේද ගැලපීම් වලට අදාලව මූල්‍ය ප්‍රකාශනවල සිදුකළ යුතු හෙළිදරව් කිරීම් කර නොතිබුණි. | 54 ඡේදය ප්‍රකාරව හෙළිදරව් කිරීමට සටහන් කර ගන්නා ලදි. | |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි, 08 වන වගන්තිය ප්‍රකාරව මධ්‍යස්ථාන කෞතුකාගාරයේ ඇති පෞරාණික වටිනාකමකින් යුත් ප්‍රවේණිගත වත්කම් පිළිබඳ හෙළිදරව් කර නොතිබූ අතර 50 වගන්තිය ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම වෙන වෙනම ගිණුම්ගත නොකර රු.32,061,929ක් වූ ඉඩම් ද ඇතුලත් ගොඩනැගිලි වෙනුවෙන් සියයට 5ක එනම් රු.1,687,075 ක ක්ෂය වෙන්කිරීම් කර තිබුණි. | මෙම විෂයෙහි තවදුරටත් උපදෙස් ලබා ගැනීම හා තවදුරටත් තොරතුරු අධ්‍යයනය කිරීම සිදුකරන අතර ප්‍රවේණිගත වත්කම් මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කිරීම සඳහා ඉදිරි කටයුතු කඩිනමින් අවසන් කිරීමට සටහන් කරගන්නා ලදි. | ප්‍රමිතයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව පිරිවැය රු.21,113,434 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගනු ලබන වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ අගය ගිණුම්ගත කිරීමට හා 92 ඡේදය ප්‍රකාරව ධාරණ අගය සටහන් මගින් හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේ වැඩි කාලයක් සංචරණ සීමා පනවා තිබූ නිසා ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇත. | ප්‍රමිතයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 09හි, 15 වගන්තිය ප්‍රකාරව තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට මැනිය යුතු වුවද රු.2,699,598ක් වූ විකිණීමට තබා ඇති පොත් තොගය ගණනය කළ පදනම 47(අ) වගන්තිය ප්‍රකාර හෙළිදරව් කර නොතිබූ අතර තොග ඒකක ප්‍රමාණය හා ඒකක වටිනාකම ඉදිරිපත් කරද නොතිබුණි. රු.394,665 ක විකුණුම් මිලට දක්වා තිබූ හානි වූ පොත් 1914 ක් 38 සිට 42 දක්වා වූ වගන්ති ප්‍රකාරව ශුද්ධ | ඉදිරියේ දී පොත් තොග වටිනාකම ගණනය කිරීමේදී පිරිවැය හෝ ශුද්ධ උපලබ්දි අගය පදනම් කර ගනිමින් ගණනය කිරීමට තීරණය කරන ලදි. හානි වූ පොත් පරීක්ෂණ මණ්ඩලයක් හරහා හඳුනාගෙන ඒවායේ වටිනාකම තක්සේරු කර මූල්‍යය ප්‍රකාශන තුල ගැලපීම් කිරීමට සටහන් කර ගන්නා ලදි. | ප්‍රමිතයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | උපලබ්ධි අගයට මූල්‍ය ප්‍රකාශන වලට ගැලපීම් කර නොතිබුණි. | | |
| (ඊ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 15 හි 14 වගන්තිය ප්‍රකාරව අයවැය ලේඛනයේ වටිනාකම් හා සත්‍ය වටිනාකම් අතර සැසඳීමක් හා එම වටිනාකම් අතර වන ප්‍රමාණාත්මක වෙනස්කම් සඳහා හේතු පැහැදිලි කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට අයවැය ලේඛනයේ වටිනාකම් හා සත්‍යය වටිනාකම් අතර වෙනස්කම් සඳහා හේතු පැහැදිලි කිරීමට සටහන් කර ගන්නා ලදි. | ප්‍රමිතයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |
| (උ) | 1998 වර්ෂයේ ජේ.ආර්.ජයවර්ධන තොරතුරු මධ්‍යස්ථානය නැමති අනුබද්ධිත පෞද්ගලික සමාගමක රු.5,000,000 ක් ආයෝජනය කර තිබුණු අතර එම සමාගම 2008 වර්ෂයේදී වසා දමා තිබුණි. මෙම ආයෝජන මුදලින් රු.700,000 ක් පමණක් නැවත ලැබී තිබූ අතර ආයතනය වසා දමා වසර 13 කාලයක් ගතව තිබුණද උපලබ්ධි කරගත නොහැකි වූ රු.4,300,000 ක මුදල දිගු කාලීන ආයෝජනයක් ලෙස දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. උපලබ්ධි නොවන මෙම ආයෝජනය අලාභයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වලට ගැලපීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | J. R. Jayewardene Information centre තුල ආයෝජනය කරන ලද රු.4,300,000ක මුදල දිගුකාලීන ආයෝජන තුලින් ඉවත් කිරීම සඳහා 2015 වර්ෂයේ දෙසැම්බර් මස 15 දින පැවති පාලක මණ්ඩල රැස්වීමේ දී පාලක මණ්ඩල අනුමැතිය ගෙන මහ භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කරනු ලැබූ අතර මහා භාණ්ඩාගාරය විසින් බුද්ධ ශාසන ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ නිර්දේශ සඳහා යොමු කර තිබේ. | මෙම ආයෝජනය අලාභයක් ලෙස ගිණුම්වලට ගැලපීම සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් කළ යුතුය. |

### 1.5.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| | අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිසි අධිකාරී බලයකින් හා අනුමැතියකින් කළ යුතු කාර්යයන් පිළිබඳ විස්තර නොදක්වා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පත් කර තිබුණු රු.18,105,318 ක් වූ ස්ථාවර තැන්පතුව ආපසු ගෙන තිබුණි. | 2021 වර්ෂය තුලදී රටතුල පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා ආයතනයේ ආදායම පහත වැටීම නිසා පුනරාවර්තන වියදම් පියවා ගැනීම සඳහා ස්ථාවර තැන්පතුව මුදල් කර ගන්නා ලදි. 2021 වර්ෂය තුලදී පාලක මණ්ඩල රැස්වීමක් නොපැවති | පාලක මණ්ඩල අනුමැතිය මත ආයෝජන ආපසු ලබා ගැනීමට කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | | අතර ඉදිරියේ දී පැවැත්වෙන පාලක මණ්ඩල රැස්වීමකදී මේ සඳහා අවශ්‍යය අනුමැතිය ලබා ගැනීමට සටහන් කර ගන්නා ලදි. | |
| (ආ) | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව මාසිකව රු.4,000ක් බැගින් වූ වෛද්‍ය දීමනාවක් හා රු.1,000ක විශේෂ දීමනාවක් සියළුම නිලධාරීන් වෙත ගෙවීම සඳහා 2021 වර්ෂය තුලදී රු.1,371,720ක් වැයකර තිබුණි. JM 1-2 ශ්‍රේණිය යටතේ වැටුප් ගෙවනු ලබන නිලධාරීන් තිදෙනෙකුට රු.1,000 බැගින් දුරකථන දීමනාද නිලධාරීන් තිදෙනෙකුට මාසිකව රු.3,000ක් හා එක් නිලධාරියෙකුට මාසිකව රු.5,000 ක් හා බැගින් වූ විධායක දීමනාද අනුමැතියකින් තොරව ගෙවා තිබුණි. | ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය විසින් වාර්ෂිකව ජාතික අයවැය යටතේ භාණ්ඩාගාරයෙන් මුදල් ලබා නොගන්නා නිසා විගණනය විසින් සඳහන් කර ඇති දීමනා සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු නොකළ අතර 1988 අංක 77 දරන ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථාන පනත මඟින් සේවකයින්ට ගෙවනු ලබන පාරිශ්‍රමික සහ දීමනා තීරණය කිරිමේ සම්පූර්ණ බලය පාලක මණ්ඩලය සතු නිසා විගණනය විසින් සඳහන් කර ඇති දිමනා ගෙවීම සඳහා අවශ්‍යය පාලක මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. | දීමනා ගෙවීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජ’නල් සටහන් 13ක් මගින් ලාභාලාභ සංචිතයට ගලපා තිබූ එකතුව රු.1,836,901ක් වූ වත්කම් හා වගකීම් අයිතම 10ක් සඳහා විස්තරාත්මක තොරතුරු හා ජ’නල් වවුචර්, රු.41,088,322ක් වූ ජ’නල් සටහන් 122කට අදාළ උපයෝගී ලියවිලි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 2021 වර්ෂයේ දී පාලක මණ්ඩල රැස්වීමක් නොපැවති නිසා පාලක මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට නොහැකි විය. ඉදිරියේ දී පැවැත්වීමට යෝජිත පාලක මණ්ඩල රැස්වීම සඳහා මෙම තොරතුරු ඉදිරිපත් කිරීමට සටහන් කර ගන්නා ලදි. | විගණනයට අවශ්‍ය තොරතුරු/ ලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971අංක 38දරන මුදල් පනතේ (8)13 උපවගන්තිය | විස්තරාත්මක විගණන වාර්තාව පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කර හෝ වාර්තාව සඳහා පිළිතුරු විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පාලක මණ්ඩල රැස්වීමක් නොපැවති නිසා විගණන වාර්තාව පාලක මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නොහැකි විය. ඉදිරියේ දී පැවැත්වීමට යෝජිත පාලක මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට සටහන් කර ගන්නා ලදි. | පනතේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුයි. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | |
| (i) | II වැනි පරිච්ඡේදයේ 1.6 උපවගන්තිය | මධ්‍යස්ථානයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර අනුමත කරගෙන නොතිබුණි. | 2022 වර්ෂයේ දී මධ්‍යස්ථානය සඳහා බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර අනුමත කරවා ගැනීමට සටහන් කර ගන්නා ලදි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුයි. |
| (ii) | XXIV වැනි පරිච්ඡේදයේ 10.4 උප වගන්තිය | අවුරුදු 10ට අඩු සේවා කාලයක් ඇති නිලධාරීන් 7 දෙනෙකුට ආපදා ණය ලබා දීමේදී ඇපකරුවන් ලබා ගෙන නොතිබුණි. | විශ්‍රාම වැටුප් හිමි බාහිර පුද්ගලයෙකුගේ ඇප සහතික වීමකට වඩා ආයතනයේම සේවකයෙකුගේ ඇප සහතික වීම අවදානම් බවින් අඩු නිසා ආයතනයේ සේවය කරනු ලබන ස්ථිර සේවකයෙකු ඇප කරුවෙකු ලෙස යොදා ගන්නා ලදි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) | මුදල් රෙගුලාසි 756 හා 757 | ස්ථාවර වත්කම් සමීක්ෂණය කර වාර්තා මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට ස්ථාවර වත්කම් සමීක්ෂණය කර එම වාර්තාව මාර්තු 31 දිනට පෙර විගණනය වෙත යොමු කිරීමට සටහන් කර ගන්නා ලදී. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුයි. |
| (ii) | මුදල් රෙගුලාසි 1645(ආ( සහ 1646 | මධ්‍යස්ථානයේ වාහන 2හි දෛනික සටහන් හා ලොග් සටහන් පොත් නිසි පරිදි පවත්වා නොතිබුණි. | 2022 වර්ෂයේ සිට දෛනික සටහන් හා ලොග් සටහන් පොත් පවත්වාගෙන යාමට අවශ්‍ය උපදෙස් සහකාර පරිපාලන නිලධාරීට ලබා දෙන ලදී. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුයි. |
| (ඈ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | උත්සව ශාලා සඳහා අයකරන සංශෝධිත ගාස්තු සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මධ්‍යස්ථාන පනත මගින් අරමුදල් සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය පාලක මණ්ඩලයට ලබා දී ඇත. ඒ අනුව ඉදිරියේ මේ සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට සටහන් කර ගන්නා ලදී. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුයි. |
| (ඉ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අනුමත අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කර නොතිබූ 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි අනුමත සහ තත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර හා ආදායම් එකතු කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කර නොතිබූ අතර පාලක මණ්ඩල අනුමැතියද ලබාගෙන නොතිබුණි. | පාලක මණ්ඩල රැස්වීමක් නොපැවති නිසා 2021 වර්ෂයේ අයවැය ලේඛණය සඳහා අනුමැතිය ලබා ගැනීමට නොහැකි විය. 2022 වර්ෂයේ සිට අයවැය ලේඛණය මගින් අදාල තොරතුරු ඉදිරිපත් කිරීමට සටහන් කර ගන්නා ලදී. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | 2003 ජුනි 02 දිනැති PED/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1වගන්තිය | 2021 අයවැය ඇස්තමේන්තුව සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. | පාලක මණ්ඩල රැස්වීමක් නොපැවති නිසා අනුමැතිය ලබා ගැනීමට නොහැකි විය. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුයි. |
| (උ) | 2019 දෙසැම්බර් 09 දිනැති අංක 03/2019 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | 2018 මූල්‍ය වාර්තා පදනම්ව 2019 වෙනුවෙන් සේවකයෙකුට රු.15,000 බැගින් රු.392,500ක් ප්‍රසාද දීමනා ලෙස 2020 දෙසැම්බර් මස ගෙවා තිබියදී, 2019 වසර සඳහා ප්‍රසාද දීමනා නොගෙවූ බවට සාවද්‍ය තොරතුරු පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කර පාලක මණ්ඩල අනුමැතිය ලබා ගෙන, එක් සේවකයෙක් සඳහා රු.54,000 බැගින් රු.1,296,000ක් 2021 වර්ෂයේදී ගෙවා තිබුණි. 2020 හා 2021 වර්ෂවල මධ්‍යස්ථානය අලාභ ලබා තිබූ බැවින් උක්ත ප්‍රසාද දීමනාව සේවකයන්ට හිමි නොවූ බැවින් 2019 වසර සඳහා බව දක්වමින් ගෙවා තිබුණි. | විගණනය විසින් සඳහන් කර ඇති ප්‍රසාද දීමනාව ගෙවා ඇත්තේ 2019 වර්ෂයේ ලාභය පදනම් කරගෙනය. 1988 අංක 77 දරන ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථාන පනත මගින් ආයතනයේ සේවකයින් සඳහා ගෙවිය යුතු දීමනා තීරණය කිරීමේ බලය පාලක මණ්ඩලය සතු වේ. එමෙන්ම සඳහන් කර ඇති මෙම ප්‍රසාද දීමනාව ගෙවීම සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලැබී ඇත. සාවද්‍යය තොරතුරු ඉදිරිපත් කර එම පාලක මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇතැයි යන ප්‍රකාශය සමඟ එකඟ විය නොහැක. | චක්‍රලේඛ විධිවිධාන අනුව ප්‍රසාද දීමනා ගෙවීමට කටයුතු කළ යුතුයි. |
| (ඌ) | 2018 අප්‍රේල් 6 දිනැති අංක දරණ DMS/1835 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් DMS/1835 අංක දරන ලිපිය මගින් 2018 අප්‍රේල් 6 දින සිට මධ්‍යස්ථානය සඳහා සේවක සංඛ්‍යාව අනුමත කර තිබූ අතර එහිදී HM 1-2 කාණ්ඩයේ වැටුප් කේතය යටතේ ලේකම් ජනරාල් තනතුර අනුමත කර | ලේකම් ජනරාල් තනතුර පත්කළ නිලධාරි තනතුරක් වන අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට සේවක සංඛ්‍යාව අනුමත කරවා ගැනීම සඳහා යොමු කරන ලද ලේඛනයේ වැරදීමකින් ලේකම් ජනරාල් තනතුර | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය අනුව කටයුතු කළ යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| | | තිබුණි. එසේ වුවද, ලේකම් ජනරාල් තනතුර සඳහා බඳවා ගැනීම් පටිපාටි සකස් කර විධිමත් පරිදි බඳවා ගැනීමට විගණිත දින දක්වා කටයුතු කර නොතිබුණි. | ස්ථිර තනතුරක් ලෙස HM 1.2 සේවා ගණය යටතේ ඉදිරිපත් කර ඇත. සිදු වී ඇති මෙම වරද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් නිවැරදි කර ගැනීමට අවශ්‍යය කටයුතු සිදු කිරීමට සටහන් කර ගන්නා ලදී. | |
| **(එ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | | | |
| (i) | මාර්ගෝපදේශ 2.8 හා 4.3 | 2014 වර්ෂයේ මධ්‍යස්ථානයේ නව තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාලව පූර්ව ප්‍රසම්පාදන කටයුතු ලෙස මුළු පිරිවැය ඇස්තමේන්තු සකස්කර අයවැය, ක්‍රියාකාරී හා ප්‍රසම්පාදන සැලසුම්වලට ඇතුලත් කිරීම, තාක්ෂණ ඇගයීම් කමිටුවක් පත්කර ගැනීම හා ප්‍රසම්පාදන ලියවිලි අනුමත කරගැනීම, අවශ්‍ය සැලසුම් අනුමත කර ගැනීම, ඉදිකිරීම් සඳහා අදාල ආයතනවල නීත්‍යානුකූල අනුමැතිය ලබාගැනීම, ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කර උපදේශකවරයෙකු තෝරා ගැනීම වැනි කටයුතු සිදු කර | නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුව සකස් කර ඇත. තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර නොමැත. එමෙන්ම ප්‍රසම්පාදන ලියවිලි අනුමත කර ගැනීම සිදු වී නොමැත. අවශ්‍ය සැලසුම් අනුමත කර ගැනීමක් හෝ අදාළ ආයතනවල නිත්‍යානුකුල අනුමැතිය ලබා ගැනීම සිදු වී නොමැත. ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කර උපදේශකවරයෙකු තෝරා ගැනීමක් සිදු කර නොමැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| | | නොතිබුණි. | | |
| (ii) | මාර්ගෝපදේශ 5.4.8 හා 8.9.2 | නව තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා තෝරාගත් කොන්ත්‍රාත්කරු සමග විධිමත් ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබූ අතර කොන්ත්‍රාත් වටිනාකමෙන් 5% කට නොඅඩු කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි. | නව තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ප්‍රසම්පාදනය පිරිනැමූ ආයතනය සමඟ විධිමත් ගිවිසුමක් අතසන් කර ඇත. කොන්ත්‍රාත් වටිනාකමෙන් 5% කට නොඅඩු කාර්ය සාධන සුරක්ෂණයක් ලබා ගෙන නොමැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුයි. |

**1.7 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බාහිර පාර්ශව වෙතින් රඳවා ගන්නා ලද මුද්දර ගාස්තු රු.7,025ක්, ජාතිය ගොඩනැගීමේ බදු රු.184,589ක් හා එකතු කළ අගය මත බදු රු.1,955,488 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමෙන් තොරව මාස 6 සිට වසර 3 දක්වා කාලයක් රඳවා තබාගෙන තිබුණි. | මෙම බදු මුදල් සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් දේශිය ආදායම් බදු දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කිරීමට සටහන් කර ගන්නා ලදි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 7,884,169ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 5,007,114ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,877,055ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි කුලී ආදායම රු. 4,018,201කින් වැඩිවී තිබුණද ස්ථාවර තැන්පතු පොලී ආදායම රු. 3,726,437කින් අඩුවීම හා ශාලා කුලී ආදායම රු. 2,744,074කින් අඩුවීම සහ සේවක පඩිනඩි රු.1,458,000කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ------------------------ | -------------- |
| (අ) | 2002 වර්ෂයේදී පෞද්ගලික බැංකුවක රු.9,725,000 ක මුදලක් ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කර තිබුණු අතර එම බැංකුව බුන්වත් වීම හේතුවෙන් මහ බැංකුව විසින් තැන්පත්කරුවන්ගේ වගකීම ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව හරහා පියවීමේ යෝජනා ක්‍රමයක් සකසා තිබුණි. ඒ අනුව අදාල මුදල් සියයට 5ක වාර්ෂික පොලියක් මත, 2017 වසරේ ආපසු ලබාගත හැකි පරිදි ණයකර ලෙස තැන්පත් කර තිබුණද පළමු වසර 02ක කාලයක් සඳහා අදාල බැංකුව එකඟ වූ පරිදි පොළී නොගෙවීම හේතුවෙන් මධ්‍යස්ථානයට රු.972,500ක පොළී මුදලක් අහිමි වී තිබුණි. 2017 දෙසැම්බර් 03 දින මෙම ණයකර කල් පිරී තිබුණද මුල් මුදල හා වසර 09 ක පොළී මුදල වූ රු.13,617,664 ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය විසින් 2002 වර්ෂයේ දී ශ්‍රී ලංකා ප්‍රමුඛ බැංකුවේ ආයෝජනය කර තිබූ රු.9,725,000 ක මුදල එම බැංකුව බංකොලොත් වීම නිසා ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝග ප්‍රකාරව 2007 වර්ෂයේ දෙසැම්බර් 03 වන දින සිට 2017 දෙසැම්බර් 03 වන දින දක්වා වූ වසර 10 කින් කල් පිරෙන ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ ණයකර තුල ආයෝජනය කරන ලදි. එම අවස්ථාවේ දී මෙම ණයකර සඳහා වර්ෂ 09 ක කාලය සඳහා අදාල පොලී ආදායම ලබා දී තිබේ.<br>මෙම මුදල් ආපසු ලබා ගැනීම සඳහා පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද පාලක මණ්ඩල රැස්වීමේ වාර්තාව ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවට ලබා දිය යුතු වුවත් පාලක මණ්ඩල රැස්වීමක් සංවිධානය කර ගැනීමට නොහැකි වූ නිසා මෙම ආයෝජන මුදල සහ පොලී මුදල ආපසු ලබාගෙන නැවත ආයෝජනය කිරීමට නොහැකි වී තිබේ. | කල් පිරී ඇති ණයකර හා වසර 09 ක පොලී ආපසු ලබා ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | මධ්‍යස්ථානය පිහිටි කොළඹ 07, ධර්මපාල මාවත අංක 191 ස්ථානයේ පවතින රූඩ් 3 පර්චස් 4.47ක් වූ ඉඩම, 1988 වසරේ මධ්‍යස්ථානය ආරම්භයේ සිටම පරිහරණය කර තිබුණද ඉඩමේ අයිතිය මධ්‍යස්ථානයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | විගණනය විසින් සඳහන් කර ඇති ආයතනයේ ඉඩම ආයතනයට පවරා ගැනීමට අවශ්‍යය කටයුතු සිදු කිරිමට සටහන් කර ගන්නා ලදි. | ඉඩමේ අයිතිය මධ්‍යස්ථානයට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොඩනැගිලි කුලියට ලබාදීමේදී ආයතන 5ක් සමග කුලී ගිවිසුම් වලට එළඹ නොතිබුණි. කුලියට ලබාදී තිබූ පරිශ්‍රවල කුලී තක්සේරු වාර්තා ලබාගෙන මිල ගණන් සංශෝධනය කර ගැනීමට | 2017 වර්ෂයේ දී රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් ඉඩම් සහ ගොඩනැගිලි වෙන් වෙන්ව තක්සේරු කරගැනීමක් සිදු කළ අතර රු.මි. 2 ක තක්සේරු ගාස්තුව නොගෙවීම නිසා තක්සේරු | නිසි පරිදි කුලී ගිවිසුම්වලට එළඹිය යුතු අතර කුලී ගාස්තු සංශෝධනයට |

| | | |
|---|---|---|
| කටයුතු කර නොතිබු අතර වර්ග අඩියක් රු.63 සිට රු.165 ක් වූ වැනි ඉතා අඩු මිල ගණන් යටතේ කුලියට ලබා දී තිබුණි. එසේම ගොඩනැගිලි කුලී ආදායම නිසි පරිදි මාසිකව අයකරගැනීමට ක්‍රමවේදයක් හා සක්‍රීය උත්සාහයක් ගෙන නොමැතිවීම හේතුවෙන් කුලී ගැණුම්කරුවන් 17 දෙනෙකුට අදාලව වසර 5 දක්වා ලැබිය යුතු රු.6,878,813 ක් අයවී නොතිබුණි. මේ වන විට කුලී පදනමෙන් ඉවත්වූ ආයතන 02ක් වෙතින් අයවිය යුතු රු.1,226,585 ක් ද ඒ තුළ විය. | දෙපාර්තමේන්තුව මඟින් වෙනත් තක්සේරු වාර්තාවක් ලබා ගැනීම සඳහා ඉහතින් සඳහන් තරන ලද තක්සේරු ගාස්තුව ගෙවන ලෙස ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය දැනුවත් කර ඇත. 2021 වර්ෂය ලැබිය යුතු සියළුම ආදායම් මේ වන විට ලැබී ඇත. එමෙන්ම ලැබිය යුතු පැරණි ශේෂයන් ගෙවන ලෙස ආදාළ ආයතන දැනුවත් කර ඇත. | කටයුතු කළ යුතුය. හිඟ මුදල් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සිවුවන කාර්තුව සඳහා ඉදිරිපත් කළ මධ්‍යස්ථානයේ ප්‍රගති වාර්තාව අනුව ක්‍රියාකාරී සැලැස්ම තුල අන්තර්ගත ප්‍රධාන ක්‍රියාකාරකම් 22න් වටිනාකම රු.6,875,000 ක් වූ ක්‍රියාකාරකම් 12ක් ආරම්භ කර හෝ නොතිබූ අතර ක්‍රියාකාරකම් 06ක් ආරම්භ කර තිබුණද ඉන් 3ක් පමණක් වර්ෂය තුල නිමකර තිබුණි. ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් වටිනාකම රු.7,490,000ක් වූ ක්‍රියාකාරකම් 9කට අදාල ප්‍රගතිය සිවුවන කාර්තුව සඳහා වූ ප්‍රගති වාර්තාවේ දක්වා නොතිබුණි. | ඇස්තමේන්තු කරන ලද ආදායමෙන් රු. මි. 10.5ක ප්‍රමාණයක් උපයා ගැනීමට නොහැකි වූ නිසා 2021 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මේ සඳහන් ව්‍යාපෘති විගණනය විසින් සඳහන් කර ඇති ආකාරයට ක්‍රියාත්මක කිරිමට නොහැකි වී ඇත. | ක්‍රියාකාරී සැලැස්ම කටයුතු කිරීමට පියවර ගත යුතුය. |

## 3.3 නිශ්කාර්යය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සිව්වන මහලේ වර්ග අඩි 600 ක් පමණ වූ පරිශ්‍රයක් කොවිඩ් 19 ව්‍යාපෘති කාර්යාලය වෙත කුලී රහිතව ලබා දී තිබූ අතර එම පරිශ්‍රය සඳහා ජල,විදුලි හා පිරිසිදු කිරීමේ පිරිවැයද මධ්‍යස්ථානය විසින් දරා තිබුණි. පන්ති කාමර වශයෙන් කුලියට ලබාදෙන වර්ග අඩි | අග්‍රාමාත්‍යය කාර්යාලය විසින් යොමු කරන ලද ලිපියකට අනුව වර්ග අඩි 600 ක් පමණ වූ පරිශ්‍රයක් කොවිඩ් 19 ව්‍යාපෘති කාර්යාලය වෙත කුලී රහිතව ලබා දී ඇත. දේශණ ශාලා ඌණ | අදාළ පරිශ්‍ර උපරිම ලෙස උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. |

| | |
|---|---|
| 2,379ක ප්‍රමාණයක් කුලී පදනම මත ලබා දීමෙන් වර්ෂය තුළ උපයා තිබූ මුදල රු. 28,244 ක් පමණක් විය. අදාළ පරිශ්‍ර උපරිම ලෙස උපයෝජනය කර නොතිබීමෙන් වසරේ වැඩි කාලයක් ඌන උපයෝජිත තත්ත්වයේ පැවතුණි. | උපයෝජිතව පැවතියේ කෝවිඩ් 19 වසංගත තත්ත්වය නිසා රජය විසින් භෞතිකව උපකාරක පංති පැවැත්වීම තහනම් කර තිබූ බැවිනි. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේ නව තෙමහල් ගොඩනැගිල්ලෙහි සම්පූර්ණ ඉදිකිරීම් කොන්ත්රාත්තුව (මහල් 3ක්) රු.6,451,087කට ඉටුකිරීම සඳහා කොන්ත්‍රාත්කරු සමග ගිවිසුමකට එළඹ තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත්තුව 2014 ජුනි 15 දින වන විට අවසන් කළ යුතු වුවත් විගණිත දින වූ 2022 සැප්තැම්බර් 08 වන විටද ගොඩනැගිල්ලේ 2 වන මහල ඉදිකර නොතිබුණි. කොන්ත්‍රාත්කරු එකඟ වී තිබූ රු.2,002,572ක් වූ කාර්යයන් ඉටුකර නොතිබියදී කොන්ත්‍රාත් මුදලින් රු.5,064,023ක් එනම් සියයට 78.5ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. කොන්ත්‍රාත්කරු එකඟ වූ පරිදි යකඩ වහලය හා යකඩ පඩිපෙල ඉදි නොකිරීම නිසා එම කාර්යයන් බාහිර පාර්ශව වෙතින් ඉටුකර ගැනීම වෙනුවෙන් රු.2,217,992 ක් අමතරව දැරීමට සිදුව තිබූ අතර මේ හේතුවෙන් ගොඩනැගිලි ඉදිකිරීම් පිරිවැයද එම ප්‍රමාණයෙන් වැඩි වී තිබුණි. | යකඩ පඩි පෙල සහ යකඩ වහලය ඉදිකිරීම කොන්ත්‍රාත්කරු විසින් පැහැර හැරිමක් සිදු නොකළ අතර අදාළ කාර්යයන් ඉවත් කර වෙනත් ආයතනය වෙත ලබා දීමට ලේකම් ජනරාල්වරයා විසින් තීරණය කරන ලදි. මේ සඳහා හේතු වූයේ අදාළ කාර්යයන් සඳහා වැඩි නිපුණතාවයක් සහිත ආයතනයකට ලබා දිමෙන් වැඩි ආරක්ෂිත හා ශක්තිමත්ව ඉදිකිරිම සඳහාය. | කොන්ත්‍රාත්තුව සම්පූර්ණ නොකිරීම තුලින් අලාභය අයකර ගැනිමට කටයුතු කළ යුතුය. අමතරව දැරිමට සිදුව තිබූ පිරිවැය අයකර ගැනිමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනයේ පිරිවිතර අනුව මෙවැනි රු.මිලියන 5-10 අතර වූ වාණිජමය කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීමේ සේවා සඳහා ගෙවිය යුතු වන්නේ කොන්ත්‍රාත් අගයෙන් සියයට 10.3 ක් වුවද, උක්ත ඉදිකිරීම වෙනුවෙන් | මෙමෙ කොන්ත්‍රාත්තුවේ මුල් වටිනාකම රු. 6,451,087 කි. එනම් එම මුදලින් 37.23% ක ප්‍රතිශතයක් උපදේශක ගාස්තු වශයෙන් ගෙවා ඇත. සඳහන් කර ඇති ලංසු වටිනාකමෙන් 8% ක් හා පැමිණෙන දිනක් වෙනුවෙන් | උපදේශක කටයුතු සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ අනෙකුත් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | උපදේශක කටයුතු සඳහා පත් කළ බාහිර ඉංජිනේරුවරයෙකුට ලංසු වටිනාකමෙන් 8% ක් හා පැමිණෙන දිනක් සඳහා රු.18,000ක් වන පරිදි ලේකම් ජෙනරාල්ගේ අනුමැතිය මත උපදේශක ගාස්තු තීරණ කර කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 37කට සමාන මුදලක් එනම් රු.2,401,761ක් ගෙවා තිබුණි. මේ සඳහා අමාත්‍යංශ ලේකම්/ප්‍රසම්පාදන කමිටු අනුමැතියක් ලබාගෙන නොතිබූ අතර ගිවිසුමකට එළඹීමට ද කටයුතු කර නොතිබුණි. | රු. 18,000.00ක් වන පරිදි ලේකම් ජනරාල්ගේ අනුමැතිය මත උපදේශක ගාස්තු තීරණය කර උපදේශක ගාස්තු ගෙවා ඇතැයි යන ප්‍රකාශය සමඟ එකඟ වෙමි. | |
| (ඇ) | පිරිසිදු කිරීමේ සේවාව සහ ආරක්ෂක සේවාව ලබා ගැනීම සඳහා 2021 වර්ෂය සඳහා සේවා සැපයුම්කරුවන් තෝරා නොගෙන පිරිසිදු කිරීමේ සේවාව 2021 පෙබරවාරි 01 දින සිට විගණිත දින වූ 2022 අගෝස්තු 31 දක්වා සහ ආරක්ෂක සේවාව 2021 ඔක්තෝබර් මස 01 දින සිට 2022 අගෝස්තු 31 දක්වා ගිවිසුම්ගත වීමෙන් තොරව පෙර සැපයුම්කරුවන් වෙතින්ම අඛණ්ඩව ලබාගෙන තිබුණි. 2020/21 වර්ෂය සඳහා පිරිසිදු කිරීමේ සේවා ගිවිසුම ප්‍රකාරව සේවයේ යෙදවිය යුතු අවම සේවකයින් දෛනිකව සේවයේ යොදවා නොතිබුණු අතර ඒ සඳහා දඩ මුදල් අයකර ගැනීමට අවශ්‍ය කොන්දේසි ගිවිසුමට ඇතුලත් කර නොතිබුණි. සේවකයින්ගේ පැමිණීම්, පිටවීම් වල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමෙන් තොරව 2021 වර්ෂයේ පිරිසිදු කිරීම් සඳහා රු.887,758 ක් ගෙවා තිබුණි. | 2021 වර්ෂය තුලදී පැවති කොරෝනා වෛරස ව්‍යාප්තිය නිසා නව පිරිසිදු කිරීමේ ආයතනයක් සහ ආරක්ෂක සේවා සපයන ආයතනයක් තෝරා ගැනීම සඳහා අවශ්‍යය ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට නොහැකි වූ අතර අදාළ සේවාවන් සඳහා පැවති ආයතනයන්ගෙන්ම එම සේවා තවත් මාස 12 ක කාලයක් සඳහා දිර්ඝ කිරීමට තීරණය කරන ලදි. ගිවිසුම් ප්‍රකාරව නියමිත සේවකයින් සංඛ්‍යාව සේවය සඳහා වාර්තා නොකරනු ලැබූවත් ආයතනය විසින් පිරිසිදු කිරීම් ගාස්තු ගෙවීමේ දී අදාළ සේවකයින් සේවයට පැමිණි දින ගණන සඳහා පමණක් ගෙවීම් කර ඇති නිසා ඒ වෙනුවෙන් අමතර දඩ මුදල් අයකර ගැනීමක් අවශ්‍යය නොවේ. 2021 වර්ෂයේ දී රසායනික ද්‍රව්‍යයන්හි මිළ ගණන් ඉහල යාමට සාපේක්ෂව අදාළ ආයතනය විසින් සිදු කරන ලද ඉල්ලීම පදනම් කර ගනිමින් රසායනික ද්‍රව්‍ය සඳහා රු. 10,000ක මුදලක් වැඩි කරන ලදි. | සේවා සැපයුම්කරුවන් වාර්ෂිකව තෝරා ගත යුතු අතර ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ආරක්ෂක සේවාව ලබා ගැනීමේදී 2020/21 ගිවිසුමානුකූලව සේවයේ යෙදිය යුතු නියමිත සේවක සංඛ්‍යාව සේවයේ යොදවා නොතිබුණු අතර ඇතැම් අවස්ථාවන්හි කම්කරු නීතිරීති වලට පටහැනිව කණිෂ්ඨ ආරක්ෂක නිලධාරින් අඛණ්ඩව සේවා මුර 18 ක් දක්වා සේවයේ යොදවා තිබුණි. | ආරක්ෂක සේවා සඳහා නියමිත සේවක සංඛ්‍යාව සේවයේ යෙදී ඇත. | ගිවිසුමානුකූලව කටයුතු කළ යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2018 අප්‍රේල් 6 දිනැති අංක DMS/1835 දරන ලිපිය මගින් මධ්‍යස්ථානය සඳහා කාර්ය මණ්ඩලය අනුමත කර තිබුණි. ඒ අනුව 36 ක කාර්ය මණ්ඩලයක් අනුමත කර තිබූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 26ක් හා තනතුරු 05ක පුරප්පාඩු 10 ක් විය. අනුමත කාර්ය මණ්ඩලය තුල මධ්‍යස්ථානයේ කාර්යභාරයට නොගැලපෙන සූපවේදී තනතුරු 02ක් පවතින නමුත් අනුමත කාර්ය මණ්ඩලය වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කරගැනීමට කටයුතු කර නොතිබුණි. උක්ත ලිපිය මගින් අනුමත කර තිබූ ගිණුම් නිලධාරී තනතුර කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2020 මාර්තු13 දිනැති අංක DMS/1835 දරන ලිපිය මගින් යටපත් කර ගණකාධිකාරී තනතුර අනුමත කර තිබුණි. ඒසේ වුවද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විමසා අවශ්‍ය සංශෝධන සිදුකර ගැනීමකින් තොරව 2013 මැයි 29 දින බඳවා ගත් සහකාර ගණකාධිකාරීවරයාට ගිණුම් නිලධාරී තනතුරට හිමි වැටුප විගණිත දින දක්වා ගෙවා තිබුණි. | ඉදිරියේදී එම සංශෝධනයන් සිදුකොට කර්ය මණ්ඩලය නිවැරදි ලෙස සංශෝධනය සිදු කරනු ලබයි. 2020 මාර්තු 13 දිනැති අංක DMS/1835 දරන ලිපිය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අයතනයේ මූල්‍ය ධාරිතාවය සහ මූල්‍ය අංශයේ කාර්යයන් සලකා ගණකාධිකාරි තනතුරක් අනුමත කර තිබූ නමුත් 2022 අගෝස්තු මාසය දක්වා වසර 2 යි මාස 5 ක කාලයක් ගතවන තෙක් ඒ සඳහා අවශ්‍යය අවධානය යොමු නොකරන ලදි. නමුත් 2022 අගෝස්තු මාසයේ දී සහකාර ගණකාධිකාරි විසින් සකස් කරන ලද ගණකාධිකාරි තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටිය අමාත්‍යාංශ ලේකම්තුමාගේ නිර්දේශය සඳහා ලේකම් ජනරාල්වරයා විසින් සහතික කර ඉදිරිපත් කරන ලදි. | අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කරගැනීමට කටයුතු කළ යුතුයි. |